# 7 වන ඒකකය - පද්ධති විශ්ලේෂණය හා පිරිසැලසුම

## පසුගිය විභාග ප්‍රශ්න - 1 පත්‍රයේ ගැටළු

### අ.පො.ස.(උ.පෙළ) – 2017

01. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රයක ඇත්නම් කදිම (nice to have) කාර්යබද්ධ නොවන අවශ්‍යතාවයක් වඩාත් ම හොඳින් විස්තර කරනුයේ පහත දැක්වෙන කුමන වගන්තියෙන් ද?
   (1) පද්ධතිය පරිශීලකයින්ට මුදල් ආපසු ගැනීමේ පහසුකම ලබා දිය යුතුම ය.
   (2) පද්ධතිය පරිශීලකයින්ට මුදල් තැන්පත් කිරීමට ඉඩ දිය යුතු ය.
   (3) පද්ධතිය සියලු ම සන්නිවේදන සඳහා බිටු 256ක ගුප්ත කේතනය භාවිත කළ යුතුම ය.
   (4) පද්ධතිය ස්පර්ශ තිර (touch screen) අතුරුමුහුණතක් පරිශීලකයින්ට ලබා දිය යුතු ය.
   (5) පද්ධතිය තත්පර 5ක් තුළ දී මුදල් මුද්‍රාහැරිය යුතුම ය.

02. අලෙවි තොරතුරු පද්ධතියක දත්ත ගැලීම් සටහනක දක්වා ඇති පහත සංකේතය ...........අඩංගු වූ ගෙවීම් තොරතුරු නිරූපණය කරයි.

| T1 (M) | Payment |
|---|---|

   ඉහත වගන්තියේ හිස්තැන පිරවීමට වඩාත් ම යෝග්‍ය වන්නේ පහත සඳහන් කවරක් ද?
   (1) ගොනු බන්දේසියක (file tray)
   (2) ඝන කඩදාසි ගොනුවක (cardboard file)
   (3) ගොනු කැබිනෙට්ටුවක (file cabinet)
   (4) දෘඪ ඩිස්කයක් තුළ ඇති දත්ත ගොනුවක
   (5) දෘඪ ඩිස්කයක් තුළ ඇති තාවකාලික දත්ත ගොනුවක

03. පහත දැක්වෙන දත්ත ගැලීම් සටහන් අතුරින් දත්ත ගැලීම් ආකෘතිකරණයෙහි නීතිවලට අනුකූලව නිවැරදි වන්නේ කමක් ද?

(1) 


(2) 


(3) 


(4) 


(5) 

04. අත්‍යාවශ්‍ය අත්‍යාවශ්‍ය නොවන, කාර්යබද්ධ සහ කාර්යබද්ධ නොවන ලෙස පද්ධතියක අවශ්‍යතා වර්ගීකරණය කළ හැකි ය. "බැංකුවක ATM යන්ත්‍රයක් පරිශීලකයකුට වැරදි ලෙස රහස් අංකය ඇතුළත් කිරීමට උත්සාහක අවස්ථා තුනකට වඩා ඉඩ ලබා නොදිය යුතුම ය."
ඉහත සඳහන් අවශ්‍යතාව නිවැරදිව වර්ගීකරණය කරන්නේ පහත සඳහන් කුමකින් ද?

(1) අත්‍යාවශ්‍ය, කාර්යබද්ධ
(2) අත්‍යාවශ්‍ය, කාර්යබද්ධ නොවන
(3) අත්‍යාවශ්‍ය නොවන, කාර්යබද්ධ
(4) අත්‍යාවශ්‍ය නොවන, කාර්යබද්ධ නොවන
(5) අත්‍යාවශ්‍ය හෝ අත්‍යාවශ්‍ය නොවන, කාර්යබද්ධ

05. පහත සඳහන් කුමන ඉන්ද්‍රිය මිනිස් ශරීරයේ සංවෘත පද්ධතියක කොටසක් වේ ද?

(1) ඇස (2) කන (3) හෘදය (4) වකුගඩුව (5) පෙනහැල්ල

06. පහත සඳහන් පද්ධති ක්‍රියාත්මක කිරීමේ ක්‍රම සලකන්න.

A - ඍජු (Direct)
B - නියාමක (Pilot)
C - සමාන්තර (Parallel)

ඉහත සඳහන් කුමන ක්‍රමය/ක්‍රම සාමාන්‍යයෙන් ගෘහස්ථ ආරක්ෂක පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට භාවිත කරනු ලබන්නේ ද?

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි. (4) A හා B පමණි. (5) A හා C පමණි.

## අ.පො.ස.(උ.පෙළ) – 2018

07. පහත දැක්වෙන කාර්ය සලකා බලන්න.

A - දැනට පවතින පද්ධතියේ ගැටළු හඳුනා ගැනීම
B - විකල්ප විසඳුම් යෝජනා කිරීම
C - තොරතුරු පද්ධතියේ අවශ්‍යතා ප්‍රමුඛත්වයට අනුව පෙළ ගැස්වීම

ඉහත කාර්යවලින් කවරක් පද්ධති සංවර්ධන ජීව චක්‍රයෙහි මූලික විමර්ශනයේ දී ඉටු කරනු ලැබේ ද?

(1) A පමණි.
(2) A හා B පමණි.
(3) A හා C පමණි.
(4) B හා C පමණි.
(5) A, B හා C සියල්ලම

08. යම් ආයතනයක් තුළ පමණක් භාවිතයට ගැනීමට නියමිත තොරතුරු පද්ධතියක් සංවර්ධනයේදී පහත කවර ශක්‍යතා ප්‍රරූපය අධ්‍යයනය කිරීම සාමාන්‍යයෙන් සිදු **නොවේ** ද?

(1) ආර්ථික ශක්‍යතාව (economic feasibility)
(2) වෙළෙඳපොළ ශක්‍යතාව (market feasibility)
(3) මෙහෙයුම් ශක්‍යතාව (operational feasibility)
(4) සංවිධානමය ශක්‍යතාව (organizational feasibility)
(5) තාක්ෂණික ශක්‍යතාව (technical feasibility)

09. පහත දැක්වෙන මෘදුකාංග සංවර්ධන ජීව චක්‍ර ආකෘති සලකන්න.

A - සර්පිලාකාර (spiral)
B - දිය ඇලි (waterfall)
C - ශීඝ්‍ර යෙදුම් සංවර්ධනය (RAD)

මුල් අදියරවල දී අවශ්‍යතා අර්ථ දැක්වීම හා ස්ථිර කිරීම කළ යුතු වන්නේ ඉහත කවරක ජීවන චක්‍රයෙහි /චක්‍රවල ද?

(1) A පමණි.
(2) B පමණි.
(3) A හා B පමණි.
(4) A හා C පමණි.
(5) B හා C පමණි.

10. ව්‍යුහගත සහ වස්තු නැඹුරු මෘදුකාංග සංවර්ධන ක්‍රමවේද පිළිබඳ පහත දැක්වෙන ප්‍රකාශ සලකන්න.

A - ව්‍යුහගත විශ්ලේෂණය හා නිර්මාණය පද්ධති ශ්‍රිත ධූරාවලියක් ලෙස දක්වයි.

B - ව්‍යුහගත නිර්මාණය යනු අන්තර් ක්‍රියාකාරී වස්තු අඩංගු පද්ධතියකි.

C - වස්තු නැඹුරු ක්‍රමවේදය දත්ත සහ ක්‍රියායන තනි භූතාර්ථවලට සංයුක්ත කරයි.

ඉහත ප්‍රකාශ අතුරෙන් කවරක් සත්‍ය වේ ද?

(1) A පමණි.
(2) A හා B පමණි.
(3) A හා C පමණි.
(4) B හා C පමණි.
(5) A, B හා C සියල්ලම

## අ.පො.ස.(උ.පෙළ) – 2019

11. පහත කවරකින් මෘදුකාංග පරීක්ෂාවෙහි නිවැරදි අනුපිළිවෙළ දැක්වෙයි ද?

(1) ප්‍රතිග්‍රහණ පරීක්ෂාව (acceptance testing) → පද්ධති පරීක්ෂාව (system testing) → ඒකාබද්ධ පරීක්ෂාව (integration testing) → ඒකක පරීක්ෂාව (unit testing)

(2) ඒකක පරීක්ෂාව (unit testing) → ප්‍රතිග්‍රහණ පරීක්ෂාව (acceptance testing) → පද්ධති පරීක්ෂාව (system testing) → ඒකාබද්ධ පරීක්ෂාව (integration testing)

(3) ඒකක පරීක්ෂාව (unit testing) → ඒකාබද්ධ පරීක්ෂාව (integration testing) → ප්‍රතිග්‍රහණ පරීක්ෂාව (acceptance testing) → පද්ධති පරීක්ෂාව (system testing)

(4) ඒකක පරීක්ෂාව (unit testing) → ඒකාබද්ධ පරීක්ෂාව (integration testing) → පද්ධති පරීක්ෂාව (system testing) → ප්‍රතිග්‍රහණ පරීක්ෂාව (system testing)

(5) ශ්වේත මංජුසා පරීක්ෂාව(white-box testing) → කාල මංජුසා පරීක්ෂාව(black-box testing) → පද්ධති පරීක්ෂාව (system testing) → ඒකක පරීක්ෂාව (unit testing)

12. මෘදුකාංග සංවර්ධන සමාගමක් තම නව පද්ධති සංවර්ධන ව්‍යාපෘතිය සංකීර්ණ අවශ්‍යතාවලින් සමන්විත බවත්, මධ්‍යම (medium) සිට ඉහළ (high) දක්වා අවදානම් (risk) මට්ටමක් ඇති බවත් හඳුනාගනියි. තවද අවශ්‍යතා පැහැදිලි කර ගැනීමට ඇගයීමක් (evaluation) අවශ්‍ය බවත් පද්ධති සංවර්ධන ක්‍රියාවලියේ දී සැලකිය යුතු වෙනස්කම් අපේක්ෂා කෙරෙන බවත් හඳුනාගනියි. මෙම ව්‍යාපෘතිය සඳහා වඩාත්ම සුදුසු මෘදුකාංග සංවර්ධන ක්‍රියාවලි ආකෘතිය (software development process model) කුමක් ද?

(1) සුචල්‍ය (agile)
(2) මූලාකෘතිකරණය (prototyping)
(3) ශීඝ්‍ර යෙදවුම් සංවර්ධනය (RDA)
(4) සර්පිල (spiral)
(5) දියඇලි (waterfall)

13. පහත කුමකින් කාර්යබද්ධ නොවන (non functional) අවශ්‍යතාවක්/අවශ්‍යතා දැක්වෙයි ද?

A - රූපයක් තමන්ගේ පැතිකඩ ඡායාරූපය (profile picture) ලෙස පද්ධතියට උඩුගත කිරීමට පරිශීලකයකුට අවස්ථාව තිබිය යුතුය.

B - පිටවීම පරීක්ෂාවේදී (check-out) අදාළ බදු අනුපාතය ඇතුළත්ව නිවැරදි වාර්ණා අගය ගණනය කළ යුතුය.

C - පද්ධතියෙහි සේවා පැවැත්ම (service availability) 99.9% ක් සපුරාලිය යුතු වේ.

(1) A පමණි.
(2) B පමණි.
(3) C පමණි.
(4) A හා B පමණි.
(5) A, B හා C සියල්ලම

14. පද්ධති ස්ථාපනය කිරීම (system deployment) පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?
   (1) ඍජු ස්ථාපනය වඩාත් ම සංකීර්ණ මෙන්ම සෙමෙන් ක්‍රියාත්මක වන ස්ථාපන ක්‍රමයකි.
   (2) නියමු ස්ථාපනයේ දී, සියලු පරිශීලකයන්ට ආරම්භයේ දී පද්ධතිය භාවිත කිරීමට හැකියාව ලැබේ.
   (3) සමාන්තර ස්ථාපනයේ දී, පැරණි සහ නව පද්ධති එකවර භාවිත කෙරේ.
   (4) අවධි ස්ථාපනය මගින් පරිශීලකයන්ට නව පද්ධතිය පිළිබඳ අවශ්‍ය වන ශිල්පක්‍රම ක්‍රමානුකූලව වර්ධනය කර ගැනීමට අවස්ථාවක් ලබා නොදේ.
   (5) අවධි ස්ථාපනය යනු මුළු පද්ධතියම එක් ස්ථානයක පමණක් භාවිත කිරීම ය.

## අ.පො.ස.(උ.පෙළ) – 2020

15. පද්ධතියක හරි වැරදි බැලීම (පරීක්ෂා කිරීම) (testing) සම්බන්ධයෙන් පහත කවර වගන්ති/ය නිවැරදි වේ ද?
   A - කාල මංජුසා පරීක්ෂාවට (black box testing) කේතයෙහි සෑම පේළියක්ම විස්තරාත්මකව පරීක්ෂා කිරීම අඩංගු වේ.
   B - ඒකක පරීක්ෂාව (unit testing) කේතවල දෝෂ අනාවරණය කිරීමට උපකාරී වේ.
   C - ඒකක පරීක්ෂාවට පෙර පද්ධති පරීක්ෂාව සිදු නොකළ යුතු ය.
   (1) A පමණි.
   (2) B පමණි.
   (3) C පමණි.
   (4) A හා C පමණි.
   (5) B හා C පමණි.

16. පහත කවරක් කාර්යබද්ධ (functional requirements) අවශ්‍යතා දක්වයි ද?
   A - පරිශීලකයන්ට තමන්ගේ ලිපින හා දුරකතන අංක යාවත්කාලීන කිරීමට අවස්ථාව ලබා දිය යුතුය.
   B - ඕනෑම පරිශීලක ඉල්ලීමකටම 2 ms ක කාලයක් තුළ ප්‍රතිචාර දැක්විය යුතු ය.
   C - පද්ධතිය පහසුවෙන් වෙනස් කිරීමට හැකි විය යුතු ය.
   (1) A පමණි.
   (2) B පමණි.
   (3) C පමණි.
   (4) A හා C පමණි.
   (5) A, B සහ C සියල්ලම

17. මෘදුකාංග ව්‍යාපෘතියකට අදාළ ව පහත විස්තර ලබා දී ඇත.
   A - අවශ්‍යතාවයන් ස්ථිර වේ (මුළු ව්‍යාපෘතිය පුරාවට වෙනස්කම් සඳහා ඉඩ නොලැබේ.)
   B - සම්පූර්ණ මෘදුකාංග නිපැයුම එක්වරම ලබා දිය යුතු ය.
   C - එක් එක් ක්‍රියාකාරකම (activity) සඳහා සියලු විස්තර සහ පිරිවිතර ව්‍යාපෘතිය අතරතුර සූදානම් කළ යුතු ය.
   මෙම ව්‍යාපෘතිය සඳහා වඩාත්ම සුදුසු මෘදුකාංග ක්‍රියායන ආකෘතිය (software process model) කුමක්ද?
   (1) සුචලාා (agile)
   (2) මූලාකෘතිකරණය (prototype)
   (3) ශීඝ්‍ර යෙදුම් සංවර්ධනය (Rapid Application Development)
   (4) සර්පිලාකාර (spiral)
   (5) දියඇලි (waterfall)

18. දත්ත ගැලීම් සටහන් (Data Flow Diagram – DFD) පිළිබඳ පහත කවර වගන්තිය **සාවද්‍ය** වේ ද?
   (1) සන්දර්භ (context) සටහන යනු ඉහළම මට්ටමේ වියුක්තකරණය (abstraction) ඇති දත්ත ගැලීම් සටහනකි.
   (2) පද්ධතියෙහි ඇති සියලුම දත්ත ගබඩා (data stores) සන්දර්භ සටහනෙහි නිරූපණය කළ යුතු ය.
   (3) DFD හි අනෙකුත් සංරචක සම්බන්ධ කිරීම සඳහා දත්ත ගැලීම් භාවිත කෙරේ.
   (4) මූලික ක්‍රියායන (elementary processes) තවදුරටත් විඛණ්ඩනය (decompose) නොකෙරේ.
   (5) DFD හි බාහිර භූතාර්ථ (external entities), දත්ත ප්‍රභව (sources) හෝ දත්ත ලබා ගන්නා (recepients) අංග ලෙස හෝ ක්‍රියා කෙරේ.

19. **A ලැයිස්තුවේ** දක්වා ඇති තොරතුරු පද්ධති වර්ග කිහිපය හා **B ලැයිස්තුවේ** දක්වා ඇති නිදසුන් කිහිපය සලකන්න.

| A ලැයිස්තුව | B ලැයිස්තුව |
|---|---|
| A1 - ව්‍යවසාය සම්පත් සැලසුම් (ERP) පද්ධතිය | B1 - බැංකුවක පවතින පාරිභෝගික ගිණුම් පද්ධතියක් |
| A2 - විශේෂඥ (expert) පද්ධතිය | B2 - නිමි ඇඳුම් ව්‍යාපාරයක නිෂ්පාදනය, අලෙවිකරණය හා වෙළෙඳාම පහසු කෙරෙන පද්ධතියක් |
| A3 – ගනුදෙනු (transaction) සැකසුම් පද්ධතිය | B3 - දැනුම් ගබඩාවක් (knowledge base) භාවිත කර ආයුර්වේද ඖෂධ නියම කෙරෙන පද්ධතියක් |

A සහ B ලැයිස්තු අතර නිවැරදි ගැලපීම වන්නේ,

(1) A1-B1, A2-B2, A3-B3
(2) A1-B2, A2-B3, A3-B1
(3) A1-B3, A2-B1, A3-B2
(4) A1-B2, A2-B1, A3-B3
(5) A1-B3, A2-B2, A3-B1

20. සුචලා ක්‍රමය (agile method) සම්බන්ධයෙන් **වැරදි** වන්නේ පහත කුමක් ද?

(1) ව්‍යාපෘතියට නිශ්චිත අවශ්‍යතා කුලකයක් ඇති විට මෙය යොදාගත නොහැකිය.
(2) කාර්ය නිමකිරීම සඳහා කාණ්ඩවලට බෙදූ කාලසටහනක් නිර්දේශ කරයි.
(3) ක්‍රමිකව, ක්‍රියාත්මක මට්ටමේ නිමැවුම පුනර්කරණ ආකාරයෙන් ලබා දේ.
(4) සෑම අදියරකදීම අදාළ පුද්ගලයින්ට (උදා: ගැනුම්කරුට, පරිශීලකයාට) ප්‍රගතිය සමාලෝචනය කර ප්‍රතිපෝෂණ ලබාදීමට පහසුකම් ලබා දේ.
(5) සෑම අදියරේදීම නිමැවුම ස්වාධීනව පරීක්ෂා (test) කෙරේ.

21. වස්තු නැඹුරු ක්‍රමලේඛනය (Object Oriented Programming) සම්බන්ධයෙන් පහත කවරක් නිවැරදි ද?

A - වස්තු හැසිරීම හා ඒවායේ අන්තර්ක්‍රියා මගින් පද්ධති ප්‍රතිදානය තීරණය වේ.
B - පද්ධතිය වස්තූන්ගේ එකතුවක් ලෙස ආකෘතිගත කෙරෙයි.
C - මෙලෙස ක්‍රමලේඛයක් ලිවීම, ව්‍යුහගත (structured) ක්‍රමයට ක්‍රමලේඛයක් ලිවීමට වඩා වෙනස් වේ.

(1) A පමණි.
(2) B පමණි.
(3) C පමණි.
(4) A හා C පමණි.
(5) A, B හා C සියල්ලම

22. ව්‍යුහගත පද්ධති විශ්ලේෂණ සහ නිර්මාණ ක්‍රමවේදයේ ක්‍රියාකාරකම් නිවැරදිව පෙළගස්වා ඇත්තේ පහත කවරක ද?

(1)ශක්‍යතා අධ්‍යයනය, භෞතික නිර්මාණය, අවශ්‍යතා විශ්ලේෂණය, අවශ්‍යතා පිරිවිතර සැකසීම, පද්ධති සංවර්ධනය
(2) ශක්‍යතා අධ්‍යයනය, අවශ්‍යතා විශ්ලේෂණය, අවශ්‍යතා පිරිවිතර සැකසීම, තාර්කික පද්ධති පිරිවිතර සැකසීම
(3) ශක්‍යතා අධ්‍යයනය, අවශ්‍යතා පිරිවිතර සැකසීම, අවශ්‍යතා විශ්ලේෂණය, තාර්කික පද්ධති පිරිවිතර සැකසීම, භෞතික නිර්මාණය
(4) අවශ්‍යතා විශ්ලේෂණය, තාර්කික පද්ධති පිරිවිතර සැකසීම, ශක්‍යතා අධ්‍යයනය, අවශ්‍යතා පිරිවිතර සැකසීම, භෞතික නිර්මාණය
(5) අවශ්‍යතා විශ්ලේෂණය, අවශ්‍යතා පිරිවිතර සැකසීම, ශක්‍යතා අධ්‍යයනය, භෞතික නිර්මාණය, පද්ධති සංවර්ධනය

- මගියකුට ආසන්නයෙන්ම සිටින ටැක්සි රියැදුරන්ගේ ලැයිස්තුවක් ලබාදෙන පද්ධතියක් සැදීමට අවශ්‍ය ය. එයට අදාළව අසා ඇති 25 සහ 26 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

23. පහතින් දක්වා ඇත්තේ පද්ධතියට අදාළ පළමු මට්ටමේ රූ සටහන යැයි සලකන්න.




ඉහත රූපයේ P, Q, R සහ S සඳහා නිවැරදි ආදේශ කිරීම් දක්වන්නේ පහත කවරක් ද?

(1) P - ස්ථානය, Q - රියදුරු කේතය, R - මගියාගේ සහ රියැදුරන්ගේ ස්ථානයන් ලබා ගන්න, S - මගියාගේ සහ රියැදුරන්ගේ ස්ථානයන්
(2) P - ස්ථානය, Q - රියැදුරු කේතය සහ ස්ථානය, R - මගියාගේ සහ රියැදුරන්ගේ විස්තර ලබා ගන්න, S - මගියාගේ සහ රියැදුරන්ගේ ස්ථානයන්
(3) P - NIC අංකය, Q - NIC අංකය, R - මගියාගේ සහ රියැදුරන්ගේ NIC අංක ලබාගන්න, S - මගියාගේ සහ රියැදුරන්ගේ NIC අංක
(4) P - මගියාගේ කේතය, Q - රියැදුරු කේතය, R - මගියාගේ සහ රියැදුරන්ගේ කේත ලබා ගන්න. S - මගියාගේ සහ රියැදුරන්ගේ කේත
(5) P - මගියාගේ කේතය, Q - ස්ථානය, R - මගියාගේ සහ රියැදුරන්ගේ ස්ථානයන් ලබා ගන්න. S - මගියාගේ සහ රියැදුරන්ගේ ස්ථානයන්

24. ඉහත පළමු මට්ටමේ DFD රූ සටහන පසුව දියුණු කරනු ලදුව, දත්ත ගබඩාවක් (D1), R ක්‍රියාවලියට සම්බන්ධ කරන ලදී. එම දත්ත ගබඩාව කුමක් විය හැකි ද?

(1) NIC දත්ත
(2) මගීන්ගේ විස්තර
(3) ටැක්සි රියැදුරන්ගේ විස්තර
(4) ගමන් වියදම් විස්තර
(5) කාලගුණ වාර්තා

25. ප්‍රතිග්‍රහණ පරීක්ෂාව සම්බන්ධයෙන් පහත කවර වගන්ති නිවැරදි වේ ද?

A - මෘදුකාංගයෙන් පරිශීලකයා අපේක්ෂා කරන දෙය විශ්ලේෂණය කරන අතරතුර ප්‍රතිග්‍රහණ පරීක්ෂාව සිදු කෙරේ.

B - කේතයේ කොන්දේසි සහිත වගන්ති සහ ලූපන පරීක්ෂා කිරීම ප්‍රතිග්‍රහණ පරීක්ෂාවේ අත්‍යවශ්‍ය කාර්යයකි.

C - ප්‍රතිග්‍රහණ පරීක්ෂාවකට පසුව පරිශීලකයන් මෘදුකාංගය භාර නොගැනීමට ඉඩ ඇත.

(1) A පමණි.
(2) B පමණි.
(3) C පමණි.
(4) A සහ C පමණි.
(5) A, B සහ C සියල්ලම

26. මෘදුකාංග ස්ථාපනය (deployment) සම්බන්ධයෙන් පහත කවර වගන්තියක් නිවැරදි වේ ද?

(1) සෘජු (direct) ස්ථාපනය පූර්ණ බිඳවැටීමක් සිදුවීමේ වැඩිම අවදානමක් සහිත වුව ද සමහර අවස්ථා සඳහා එය එකම සුදුසු ක්‍රමය වේ.

(2) සෘජු ස්ථාපනය වැඩිම වියදම් සහිත ක්‍රමය වන අතර පරිශීලකයන්ට හෙමින් පද්ධතිය ගැන ඉගෙනීමට ඉඩ දෙයි.

(3) සමාන්තර (parallel) ස්ථාපනය අඩුම වියදමක් සහිත ස්ථාපන ක්‍රමයයි.

(4) අවධි (phased) ස්ථාපනය පද්ධතියට අවශ්‍ය යම් යම් වෙනස්කම් කිරීමට අදාළ සංවිධානයට නිදහස නොදේ.

(5) නියාමක (pilot) ස්ථාපනය හැමවිටම පරිශීලකයන්ගෙන් කට වැඩි පරිශීලක කණ්ඩායමකට නව පද්ධතිය පරීක්ෂාව සඳහා යොමු කරයි.

27. පහත කවර වගන්ති නිවැරදි වේ ද?

A- ව්‍යාපාර ක්‍රියාවලිය ප්‍රති-ඉංජිනේරුකරණය(business process re-engineering) , දැනට පවතින ව්‍යාපාර ක්‍රියාමාර්ග, වාණිජ පෙර නිමි පැකේජ (COTS) වලට ගැලපෙන පරිදි වෙනස් කිරීමට උදව් වේ.

B- පෙර නිමි පැකේජවල ඇති ඇතැම් අනවශ්‍ය විශේෂාංග වෙනුවෙන් ද මුදල් ගෙවීමට පරිශීලකයන්ට සිදුවීමට ඉඩ ඇත.

C- ආයතනයක අවශ්‍යතා අනුව පමණක්ම විශේෂයෙන් සහ හොඳින් සකසා ඇති මෘදුකාංගයකින් (custom software) එම ආයතනයට තරගකාරි වාසියක් ලැබීමට ඉඩ ඇත.

(1) A පමණි. (2) B පමණි.

(3) A සහ B පමණි. (4) B සහ C පමණි.

(5) A, B සහ C සියල්ලම

පිළිතුරු

| **ප්‍රශ්න අංකය** | **පිළිතුර** | **ප්‍රශ්න අංකය** | **පිළිතුර** | **ප්‍රශ්න අංකය** | **පිළිතුර** | **ප්‍රශ්න අංකය** | **පිළිතුර** | **ප්‍රශ්න අංකය** | **පිළිතුර** | **ප්‍රශ්න අංකය** | **පිළිතුර** |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| **1** | 4 | **6** | 5 | **11** | 4 | **16** | 1 | **21** | 5 | **26** | 1 |
| **2** | 1 | **7** | 3 | **12** | 4 | **17** | 5 | **22** | 2 | **27** | 5 |
| **3** | 3 | **8** | 2 | **13** | 3 | **18** | 2 | **23** | 2 | | |
| **4** | 2 | **9** | 2 | **14** | 3 | **19** | 2 | **24** | 3 | | |
| **5** | 3 | **10** | 3 | **15** | 5 | **20** | 1 | **25** | 3 | | |